IPRC/16/167

# ශ්‍රී ලාංකීය බෞද්ධ කාන්තාව සහ ප්‍රාදේශිය දේශපාලන ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනයක්

බොදාගම සුමන හිමි[1*], කරුපික්කාඩ සොබිත හිමි[1], පී.ඩබ්.පී. ධම්මික වීරකෝන්[2]

ප්‍රාග් බෞද්ධ යුගයේ දී කාන්තාවන්ට ආගමික, දේශපාලනික හා සමාජීය නිදහසක් නොතිබුණු යුගයකි. මෙවන් වකවානුවක බුදුරජාණන් වහන්සේ කාන්තාවට නිදහස් පරිසරයක් උදාකරලීම සඳහා චින්තනමය විප්ලවයක් සිදු කරන ලදි. කාන්තාව පුරුෂයන් හා සමානත්වයෙහි සළකා කටයුතු කළ අතර "ගෙදර බුදුන් අම්මා, ස්වාමියාගේ හොඳම යෙහෙළිය බිරිඳයි" යනාදි දේශනා මගින් මවක්, යෙහෙළියක්, දියණියක්, ගෘහණියක් වශයෙන් ඇයට හිමිවිය යුතු අයිතිවාසිකම් ලබාදීම උදෙසා මහත් කාර්යභාරයක් සිදු කරන ලදි. බෞද්ධ සාර ධර්මවලට අනුව කාන්තාව යනු සාමාජික, ආර්ථික, දේශපාලනික හා ආගමික අයිතීන් හමුවේ තම ශක්තිය බුදු දහමින් පෝෂණය ලබා ඇති බෞද්ධ සංස්කෘතියට උරුමකම් කියන මුළුමහත් මානව වර්ගයාගේ යහපත උදෙසා කටයුතු කළ හැකි තැනැත්තියක් බව පසේනදි කොසොල් රජුට දියණියක් ලැබ දුක්මුසුව සිටිනා විට දී පෙන්වා දී ඇත. මෙකල කාන්තාවක් ලෙස උපත ලැබීම මහත් පාපයක් ලෙස සැලකූ යුගය කාන්තාව ද සමාජ සුභසිද්ධිය වෙනුවෙන් කටයුතු කරන්නට හැකි පිරිසක් ලෙස බුදු දහමේ පෙන්වා දෙයි. ශ්‍රී ලාංකීය ආර්ථිකය විමසන කල්හි කාන්තාව සතු කාර්යභාරය මවක්, දියණියක්, සොයුරියක් හා බිරිඳක් වශයෙන් සාමාජයට විශේෂ සේවාවන් රැසක් ඉටුකරන බව පෙන්වා දිය හැක. සංවර්ධන ක්‍රියාවලියේ දි ගෙවිලියක් සහ කම්කරු ලෙස ශ්‍රමය කැපකරන කාන්තාව අධ්‍යාපනය ලබා නගරයට පැමිණෙන විට සෞඛ්‍යය, අධ්‍යාපන, ආරක්ෂක, පරිපාලන, ගුවන් සේවා, කර්මාන්ත, ව්‍යාපාර, මාධ්‍ය ,ධිවර, දේශපාලනය ආදි ක්‍ෂේත්‍ර රැසක කටයුතු කරන බව පැහැදිලිය. නමුත් ඇතැම් කේෂත්‍රවලට කාන්තා නියෝජනය අවශ්‍යවුවත් ඒවායේ ඇය රැදි සිටින්නේ සුළු වශයෙන්වීම කණගාටුවට කරුණකි. .දේශපාලන යනු පිරිමින්ට හුදෙක්ම අයත් කේෂත්‍රයක් ලෙස සිතිය යුතු නැත.

අපේ රටේ දේශපාලන ක්ෂේත්‍රයට කාන්තා නියෝජනය සිය දහස් ගණනින් අවශ්‍ය යුගයකි. කාන්තාවන් දේශපාලන නියෝජනය කිරිම නිසා ගමක්, පළාතක්, රටක් සුන්දරවනු ඇත. ජනතා ප්‍රශ්න, තරුණ ගැටලු, ළමා ප්‍රශ්න ආදියෙහි සංවේදි කාන්තා ඇසකින් මනාව ස්පර්ශ වනු ඇත. දේශපාලනයේ යෙදෙන අනෙකුත් පාර්ශව සංවේදි කිරිමට අලුත් ඇසකින් ලෙව දකින්ට කියාදිමට ඇයට හැකිවනු ඇත.මේ තුළින් කාන්තා ප්‍රචණ්ඩත්වය, කාන්තා හිංසනය පිටු දැකිමට හැකිවනු ඇත. කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා වඩා පුළුල් සහභාගිත්වයක් දක්නට ලැබෙන්නේ කාන්තාවන් අධ්‍යාපනය තුළින් බළගැන්වීම මගිනි . 19 වන සියවස අග දී ක්‍රියාත්මක වූ බෞද්ධ හා හින්දු පුනර්ජීවය තුළ කාන්තා අධ්‍යාපනය සඳහා විශේෂ මෙහෙවරක් ඉටුවිය. මෙම ව්‍යාපාරය උගත් සංස්කෘතියක් රකින,දේශියත්වය පිළිගත් නව තුල කාන්තාවන් බිහිකිරිමේ කාර්යයට උරදි සිටියේය. ශ්‍රී ලංකිය දේශපාලනයේ ප්‍රාදේශිය දේශපාලන ක්‍රියාවලිය කාන්තා නියෝජනය ශක්තිමත් කිරිමට නම් ක්‍රියාකාරි වැඩ පිළිවෙළකින් යුක්ත වියයුතු බව මෙම අධ්‍යනයෙන් පෙන්වාදිය හැක.

***ප්‍රමුඛ පද:*** *කාන්තාව, කාන්තා අයිතිවාසිකම්, ප්‍රදේශිය දේශපාලනය, කාන්තා නිදහස, බුදු දහම*

[1] භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *bsumana@busl.ac.lk
[2] ඩී. එස්. සේනානායක මහජන පුස්තකාලය, මහනුවර